# ඉතිහාසය

## අ.පො.ස. (උ/පෙළ)



The National e-learning Portal for The General Education

**Start Your Learning Journey with e-thaksalawa**



## පෘතුගීසි පාලන සමයේ වැදගත් සිදුවීම් (ක්‍රි.ව. 1505 - 1658)

- ක්‍රි.ව. 1505 නොවැම්බර් 15 දින පෘතුගීසි ජාතික ලොරෙන්සෝද අල්මේදා ලංකාවට පැමිණීම
- ක්‍රි.ව .1505 - 1551 - පෘතුග්‍රීසි හා ලංකා රජය අතර මිතුරු කාලය
- ක්‍රි.ව. 1509 . Viii වීර පරාක්‍රමබාහු රජුගේ මරණය ( අම්බුළුගල කුමරු)
- ක්‍රි.ව. 1517 ලෝපෝසෙරෝ ද ඇල්බර්ගේරියා කොළඹ වරායට පැමිනණීම (ජුවාම් රුබේරු ගේ වාර්තා)
- ක්‍රි.ව. 1521 විජබා කොල්ලය, කෝට්ටේ රාජ්‍ය රයිගම, සීතාවක, කෝට්ටේ නමින් කොටස් 03 කට බෙදීම
- ක්‍රි.ව. 1538. රයිගම් බණ්ඩාර හෙවත් පරරාජසිංහ කුමරුගේ මරණය
- ක්‍රි.ව. 1543 මාර්තු 12 - ධර්මපාල කුමරුගේ රුවකට පෘතුගීසි රජු ඔටුනු පැළඳවීම
- ක්‍රි.ව. 1543 ප්‍රැන්සිස්කන් නිකායට අයත් පූජකවරු පස්දෙනෙකු ලංකාවට පැමිණ කතෝලික ආගම ප්‍රචාරය .

## ක්‍රි.ව. 1551 -1597 පෘතුගීසින් කෝට්ටේ රාජ්‍යයේ ආරක්ෂකයාව සිටි කාලය .

- ක්‍රි.ව. 1551 සෙදසැම්බර් 20 - vii බුවනෙකබාහු වෙඩි තබා මරා දමයි ( කුටෝ/ කුතෝ ගේ වාර්තා)
- ක්‍රි.ව. 1557 ධර්මපාල කුමරු කතෝලික ආගම වැළඳගෙන දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් බෞතිස්ම ලැබීම.
- ක්‍රි.ව. 1557 - කොළඹ කොටුවට මුල්ගල තැබීම
- ක්‍රි.ව. 1562 අගෝස්තු - මුල්ලේරියා වෙලේ සටන (ක්වේරෝස් ගේ වාර්තාව)
- ක්‍රි.ව. 1564 - ටිකිරි කුමරු කොළඹ හා කෝට්ටේ වටලෑම
- ක්‍රි.ව. 1565 - කොළඹ හා කෝට්ටේ යන මධ්‍යස්ථාන දෙක ම රැක ගත නොහැකි වූ පෘතුගීසින් ධර්මපාල රජු සමඟ කොළඹට පලායාම.
- ක්‍රි.ව. 1577 මායාදුන්නේ කුමරු ධර්මපාල රජුට වස දීමට තැත්කිරීම
- ක්‍රි.ව. 1578 මායාදුන්නේ රජු ටිකිරි කුමරුට රාජ්‍ය පැවරීම
- ක්‍රි.ව. 1580 අගෝස්තු 12 - ධර්මපාල රජු පූජකවරුන්ගේ බලපෑමෙන් තමාගෙන් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසින්ට උරුම වන පරිදි. අවසන් කැමති පත්‍රයක් ලිවීම
- ක්‍රි.ව. 1581 මායදුන්නේ රජුගේ මරණය (ක්වේරොස්)
- ක්‍රි.ව. 1582 - සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කොට අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1590 දොන් පිලිප් (යමසිංහ බණ්ඩාර) මරා කොනප්පු බණ්ඩාර හෙවත් දොන් ජුවන් (දොන් ජෝන්) I විමලධර්මසූරිය යන බෞද්ධ නාමය ලබාගෙන උඩරට රජ වීම.1591 -පෘතුගීසි ජාතික fපාර්ටාඩෝ විසින් යාපනයේ පරරාජසේකරම් පැරදවීම
- ක්‍රි.ව. 1592 - i රාජසිංහ රජුගේ උඩරට ආක්‍රමණය
- ක්‍රි.ව. 1592 මාර්තු - 1 රාජසිංහ රජුගේ මරණය.
- ක්‍රි.ව. 1594 දන්තුරේ සටන (විමලධර්මසූරිය රජු - පේරෝලෝපේස්ද සුසා)


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රි.ව. 1597 1658 පෘතුගීසින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පාලනය කළ අවධිය .

- ක්‍රි.ව. 1597 මැයි - ධර්මපාල රජුගේ මරණය (ක්වේරෝස් වාර්තා)
- ක්‍රි.ව. 1602 බලන සටන ( i විමලධර්ම සූරිය රජු - දොන් ජෙරනිමෝ ද අසවේදු)
- ක්‍රි.ව. 1602 ජූනි - විමලධර්මසූරිය රජු ඕලන්ද ජාතික ජෝර්ජ් ෆන් ස්පිල්බර්ජන් හමුවීම (ස්පිල්බර්ජන්)
- ක්‍රි.ව. 1602 සැප්තැම්බර් - සිබෙල් ද වර්ට් උඩරට විමලධර්මසූරිය රජු හමු වීම (සිබෝල්ඩ් ද වියට්)
- විමලධර්ම සූරිය රජු ගැටඹේ තොටේදී උපසම්පදා විනය කර්මයක් සිදුකරවීම 1603
- ක්‍රි.ව. 1605 කුසුමාසන දේවිය විවාහ කරගත් සෙනරත් කුමරු උඩරට රජ වීම
- 1612 මාර්තු 08 - මාෂල් ද බොක්කෝවර් නම් ඕලන්ද ජාතිකයා සෙනරත් රජු මුණ ගැසීම
- ක්‍රි.ව. 1617 අගෝස්තු 24 - සෙනරත් රජු හා පෘතුගීසි න් අතර ගිවිසුම
- ක්‍රි.ව. 1620 ගිවිසුම කඩකර පෘතුගීසින් උඩරටට විරුද්ධව ක්‍රියාකිරීම.
- ක්‍රි.ව. 1623 පෘතුගීසින් ත්‍රිකුණාමල වරාය අල්ලාගැනීම
- ක්‍රි.ව. 1628 පෘතුගීසින් මඩකලපුව වරාය අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1629 සෙනරත් රජු උඩරට රාජ්‍ය මහා අස්ථාන, කුමාරසිංහ, විජේපාල ආදී කුමාරයන් අතරේ බෙදාදීම
- ක්‍රි.ව. 1630 අගෝස්තු 02 - රන්දෙනිවෙල සටන සඳහා පෘතුගීසින් පිටත් වීම
- ක්‍රි.ව. 1630 අගෝස්තු 24 රන්දෙනිවෙල සටන ( සෙනරත් රජු - කොන්ස්තන්තී නූ ද සා)
- ක්‍රි.ව. 1635 සෙනරත් රජුගේ මරණය
- ක්‍රි.ව. 1637 ලන්දේසි ජාතික වෙස්ටර් වෝල්ඩ් පෘතුගීසි නැව් වලට පහරදීම
- ක්‍රි.ව. 1638 රජු හා ලන්දේසි ගිවිසුමක්. (ii රාජසිංහ - අද්මිරාල් වෙස්ටර් වෝල්ඩ්)1638 පෙබරවාරි - ගන්නෝරුව සටන සඳහා හමුදාව පිටත් වීම
- ක්‍රි.ව. 1638 මාර්තු 28 - ගන්නෝරුව සටන - මේළෝ මියයාම (ii රාජසිංහ - දියෝගෝ ද මෙලෝ කැස්ත්‍රෝ)
- ක්‍රි.ව. 1638 අප්‍රේල් 18 ලන්දේසින් මඩකලපුව කොටුව අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1639 මැයි 02 - ලන්දේසින් ත්‍රිකුණාමල වරාය අල්ලාගැනීම
- ක්‍රි.ව. 1640 පෙබරවාරි 4/9 - ලන්දේසි ආණ්ඩුකාර ලූකස් මිගමුව කොටුව අල්ලා ගැනීම
- ක්‍රි.ව. 1640 මාර්තු 13 - කොස්ටර් විසින් ගාල්ල කොටුව අල්ලාගැනීම
- ක්‍රි.ව. 1644 නොවැම්බර් 10 - ලන්දේසි හා පෘතුගීසින් අතර ගිවිසුමක් මඟින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ බෙදා ගැනීම
- ක්‍රි.ව. 1650 ඔක්තෝම්බර් 04 ලන්දේසි පෘතුගීසි මිත්‍ර දම් බිඳවැටීම.
- ක්‍රි.ව. 1656 මැයි 07 - කොළඹ කොටුව ලන්දේසින් අතට පත්වීම
- ක්‍රි.ව. 1658 පෙබරවාරි 18 - ලන්දේසි රයික් ලොප්ලෑන් ගොයන්ස් විසින් මන්නාරම් කොටුව අල්ලාගැනීම
- ක්‍රි.ව. 1658 ජූනි - ලන්දේසින් විසින් යාපනය අල්ලා ගැනීම.

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පෘතුගීසී පාලනය (ක්‍රි.ව. 1397 - 1656)

### මධ්‍ය පාලනය

- ගෝව බොම්බාය., මලක්කාව , මලයා අර්ධද්වීපය ලංකාව ආදී ප්‍රදේශ පෘතුගීසි අධිරාජ්‍යයට යටත්ව තිබූ අතර පෙරදිග ඔවුන්ගේ පාලන මධ්‍යස්ථානය ගෝවේ විය.
- ලංකාවේ පෘතුගීසි පාලනය ගෝවේ විසුරේ (පතිරාජ) යටතේ ක්‍රියාත්මක වීම.
- ගෝවේ විසුරේ යටතේ ලංකාවේ ඔවුන්ට අයත් වූ ප්‍රදේශ පාලනය කරනු ලැබුවේ (මහා සේනාපති) කපිතාන් ජනරාල් යටතේය. ඔහුගේ පාලන මධ්‍යස්ථානය වූයේ මල්වාන ප්‍රදේශයේය. ඔහු මල්වානේ රජු හෙවත් “නෛකශීන් විරාජමාන ”(Highness ) ජන රජ නමින් හැඳින්විත
- මල්වානේ කපිතාන් ජනරාල්ට සහයවනු පිණිස ආණ්ඩුවේ ආදායම් භාරව විදෝරේද (වෙඩෝද) පැසෙන්ඩා නම් නිළධාරියෙක් විය.
- පෘතුගීසි පාලන ප්‍රදේශ වල යුධ පාලනය සේනාපති හෙවත් කැප්ටන් මේජර් ට හිමිවිය. ( Captain Major) ඔහුගේ පාලන මධ්‍යස්ථානය මැණික්කඩවර විය. කසාදෝ (විවාහක) සොල්දාදෝ (අවිවාහක) නමින් සොල්දාදුවන් වර්ග දෙකකි. පෘතුගීසින් යටතේ සිටි ස්වදේශික භටයන් (ලංසාකාර ලස්කිරිඤ්ඤ) දිසාවේ වරයා යටතේ හෝ වික්‍රමසිංහ නම් නිළධාරියා යටතේ සංවිධානය විය .
- පෘතුගීසි පාලන ප්‍රදේශ වල අධිකරණ කටයුතු බාරව ඔව්ඩෝර් නම් නිලධාරියෙක් විය.
- ආගමික පාලනය කොචින්හි බිෂොප් තුමා වෙනුවෙන් පෙනි සිටි විකාන් ජනරාල් නැමැති පූජකයෙකුගේ නායකත්වයෙන් සිදුවිය
- පෘතුගීසින් කොළඹ නගරය සෙන්රිට් ලෝරන්ස් නගරය ලෙස හැඳින්වූ අතර එය වෙම්බර් නමින් හඳුන්වන ලද නාගරික සභාවක් විසින් පාලනය කරන ලදී.

### ප්‍රාදේශිය පාලනය

- ලංකාවේ පෘතුගීසි පාලන ප්‍රදේශ පාලනයේ පහසුව සඳහා දිසා 04 කට බෙදා (පළාත්) පාලනය කරන ලදී

1. මාතර දිසාව - වර්තමාන දකුණු පළාත, කොළොන්න කෝරලය, කළුතර දිස්ත්‍රික්කය, සල්පිටි කෝරලය, ගාලු නගරය
2. සතරකෝරලය - සියනෑ කෝරලය, හාපිටිගම් කෝරලය, කෑගලු දිස්ත්‍රික්කයේ උතුරු කොටස
3. සත්කෝරලය - වයඹ පළාත, උතුරු පළාතේ වැඩි කොටසක් කොළඹ සිට කුදිරමලෙයි දක්වා මුහුදු තීරය
4. ක්‍රි.ව. 1640 දී මීගමුව නම් නව දිසාවක් පිළිබඳව ද තොරතුරු හමු වීම

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- මෙම දිසාවන් දිසාපති වරුන් හෙවත් පළාත් ආණ්ඩුකාර වරයෙකු යටතේ පාලනය විය. තම දිසාව තුළ සිවිල්, යුද හා අධිකරණ කටයුතු මෙහෙය වීම ඔහුට පැවරී ඇත. මුලින් මෙම තනතුරු සිංහලයින් හට පිරිනැමූ අතර පසුකාලීනව පෘතුගීසින් ම පත්වූහ.
- මෙම දිසාවක් කෝරල කිහිපයකට බෙදා පාලනය වූ අතර අදිකාරම් වරයෙකු යටතේ කෝරල පාලනය විය. පසුකාලීන ව මෙම අධිකාරම් වරයා කෝරලේ විදානේ නොහොත් කෝරාළ නමින් හඳුන්වන ලදී.
- කෝරළයක් පත්තු නමින් පාලන ඒකක කිහිපයකට බෙදා තිබුනි. ඒවා පාලනය කරන ලද්දේ අතුකෝරාල නම් නිලධාරියෙකු විසිනි.
- පත්තුවකට ගම් කිහිපයක් තිබූ අතර ගම්, ගම් මුලාදෑනියන් විසින් පාලනය කරන ලදී.
- යාපනය, මන්නාරම ආදී ප්‍රදේශ ඉහත කී දිසාවන්ට අයත් නොවූ අතර එම ප්‍රදේශ කප්පිත්තා (කපිතාන්) නම් නිලධාරියෙක් විසින් පාලනය වූ අතර ඔවුන් මල්වානේ කපිතාන් ජනරාල්ට වගකිව යුතුය.
- ආදායම් පාලනය අධිරාජයා විසින් සිදුකරන ලදී. කුරුඳු ආදයම් මහ බද්දේ රාල විසින් රැස්කරන ලදී. මරාල බද්ද රැස්කිරීම සඳහා දිසාවක් සඳහා මරාලේ නම් නිලධාරියෙක් විය.

## පෘතුගීසීන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය

- යුරෝපයේ ඉහළ ඉල්ලුමක් පැවති කුළුබඩු ඇතු`ළු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රධාන ආර්ථික අරමුණ වීම
- ඒ සඳහා අරාබි, චීනය, මලබාර් වැනි ආසියානු වෙළෙන්ඳන් සතු වෙළෙඳ අයිතිය ලබා ගැනීමට ක්‍රියා කිරීම
- පෘතුගීසි දේශපාලන අධිකාරිය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම
- ස්වදේශීය සමාජ ආර්ථික සංස්ථා උපයෝගී කරගැනීම

  **උදාහරණ**

  ⇒ ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය, අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය, බදු ක්‍රමය

  ⇒ ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරයක් ක්‍රියාත්මක කිරීම (කුරුඳු, අලි ඇතුන්, මැණික්, මුතු වැනි )
- උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාම සිදු කිරීම
- ආනයනය, අපනයන වෙළෙඳාමක් පවත්වාගෙන යාම
- අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk



## පෘතුගීසින්ගේ ආගමික ප්‍රතිපත්තිය

- පෘතුගීසින් සිය යටත්විජිත ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන අරමුණක් ලෙස රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම වූ අතර ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙන ආගමික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
  - ⇒ පෘතුගීසි ආණ්ඩුවට පක්ෂපාති රටවැසියන් පිරිසක් ඇති කර ගැනීම
  - ⇒ පෘතුගීසි ආණ්ඩුව හා කෝට්ටේ ජනතාව සම්බන්ධ කළ පුරුක වූ ප්‍රභූන් ආගම ට හරවාගෙන දේශපාලන වාසි ලබා ගැනීම
- ජේසුයිට්, ෆ්‍රැන්සිස්කන්, ඩොමිනිකන් වැනි මිෂනාරී සමාගම් විසින් ආගම් ප්‍රචාරය සිදු කිරීම
- යාපනය රාජ්‍යයේ ද කතෝලික ධර්මය ව්‍යාප්ත කිරිම
- ආගම් ප්‍රචාරය සඳහා විවිධ ක්‍රියාමාර්ග යොදා ගැනීම
  - ⇒ අධ්‍යාපනය
  - ⇒ දේශන පැවැත්වීම
  - ⇒ තිළිණ, සම්මාන හා නිලතල ප්‍රදානය කිරීම
  - ⇒ බදුවලින් නිදහස් කිරිම
  - ⇒ අධිකරණ කටයුතුවල දී සහන ලබා දීම
  - ⇒ ආණ්ඩුව අනුමත කළ ආගම් පමණක් ඇදහීමට අවස්ථාව ලබා දීම
- මුස්ලිම්වරුන් සම්බන්ධයෙන් ඉතා දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
- ඇතැම් බෞද්ධ සිද්ධස්ථාන කතෝලික සිද්ධස්ථාන බවට පත් කිරීම
- මෙරට පැවති ආගමික සහනශීලීත්වය හා අන්‍යාගම්වලට ගරු කිරීමේ ප්‍රතිපත්තිය බිඳවැටීම
- පැරිස් පාසල් ආදී අධ්‍යාපන ආයතන පිහිටුවා අංක ගණිතය, ලතින් භාෂාව, සංගීතය වැනි විෂයයන් ඉගැන්වීම

## පෘතුගීසීන්ගෙන් සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රවලට ලැබුණ දායාද

- එස් පිරිටල්' නමින් හැඳින්වූ කුඩා ආරෝග්‍යශාලා ආරම්භ කිරීම
- දේවස්ථාන හා සම්බන්ධ වූ 'මඩම්' නැමති සමාජසේවා ආයතන හඳුන්වා දීම
- සිංහල ජන සමාජයට පෘතුගීසි නම් එකතු වීම

  උදාහරණ :

  - ⇒ සීමන්, මැන්දිස්, සිල්වා, පෙරේරා, ජුවාන්, කැතරින්, අල්මේදා, ජෝන්, ද වාස්.
- පෘතුගීසි ඇඳුම් මෝස්තර - කමිස, කලිසම්, කබා, සාය, අත්දිග හැට්ට යනාදිය
- පෘතුගීසි ආහාර - සම්බෝල, අච්චාරු, විනාකිරි, සලාද, පාන්, වයින්
- චේදිකා නාට්‍ය ක්‍රමය, බයිලා, කපිරිඤ්ඤා වැනි අංග සංගීත ක්ෂේත්‍රයට හඳුන්වා දීම
- බෝග හඳුන්වා දීම - අන්නාසි, රටදෙල්, රඹුටන්

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ලන්දේසි පාලනය

## ලන්දේසීන්ගේ පාලන ප්‍රතිපත්ති

- අඩු වියදමකින් උපරිම ලාභ ලැබීමේ අරමුණින් ලන්දේසි පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- හැකි සෑම විට ම දේශීය පාලන ක්‍රමය යොදා ගැනීම
- වෙළෙඳ සමාගමේ ප්‍රධානත්වයෙන් පරිපාලන රටාව ගොඩනගා තිබීම
- ඉහළ ම මණ්ඩලය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වීම
- බතාවියේ අග්‍රාණ්ඩුකාරවරයා සහ ඔහුගේ උපදේශක සභාව ගාල්ලේ ආණ්ඩුකරු සහ ඔහුගේ උපදේශක සභාව
- කොමොන්ඩරි ක්‍රමය ආරම්භ කිරීම
- කොළඹ, ගාල්ල, යාපනය ලෙස කොමාන්ඩරි තුනකට බෙදා ඒවා කොමදෝරු වරුන් යටතේ පාලනය කිරීම
- දේශීය අධිකරණ පද්ධතියේ ද යම් යම් අංග ප්‍රයෝජනයට ගනිමින් නව උසාවි පද්ධතියක් හඳුන්වා දීම
  - ⇒ රාද් වැන් ජස්ටිට් - මහාධිකරණය
  - ⇒ ලෑන්ඩ්රාද් - ඉඩම් උසාවිය
  - ⇒ සිසිවිල් රාද් - සිවිල් උසාවිය
- මුහුදුබඩ වැසියන්ට රෝම ලන්දේසි නීතියත්, යාපනේ වැසියන්ට තේසවලමේ නීතියත්, මුස්ලිම් වරුන්ට මහම්මද් නීති සංග්‍රහයත් හඳුන්වා දීම

## ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය

- කුරුඳු ඇතුළු වැඩි වටිනාකමක් තිබූ වෙළෙඳ භාණ්ඩ මෙරටින් ලබාගන්නා අතර වෙළෙඳාමේ අයිතිය ලබා ගැනීම ලන්දේසින්ගේ ප්‍රධාන ආර්ථික අරමුණ වීම ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් ආර්ථික කටයුතු මෙහෙය වීම
- දේශීය ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය පදනම් කරගත් සමාජ රටාව සහ සාම්ප්‍රදායික චාරිත්‍රවිධි ඇසුරින් අඩු වියදමකින් ලාභ ලැබීම
- ඇතැම් වෙළෙඳ ද්‍රව්‍ය, සම්බන්ධයෙන් ඒකාධිකාරයක් පවත්වාගෙන යාම (කුරුඳු, අලි ඇතුන් වෙළෙඳාම, මැණික් ගැරීම සහ විකිණීම. මුතු විකිණීම)
- ප්‍රධාන ආදායම් උපයන භාණ්ඩයක් ලෙස පුවක් වැදගත් වීම
- උඩරට රාජ්‍යය සමඟ අභ්‍යන්තර වෙළෙඳාමක් පවත්වා ගෙන යාම
- ඵෑණු, කරවල වැනි දෑ උඩරටටත් එම ප්‍රදේශයෙන් ගම්මිරිස්, බුලත්, කරාබුනැටි, කරඳමුංගු, මී පැණි ඇතුළු ද්‍රව්‍ය සමූහයක් වෙරළබඩ ප්‍රදේශ වලටත් තවලම් මඟින් ප්‍රවාහණය කිරීම
- ආනයන, අපනයන වෙළෙඳ රටාවක් පවත්වා ගෙන යාම

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- අන්තර් ආසියාතික වෙළෙඳාමට සම්බන්ධ වීම.
- ලන්දේසි ආණ්ඩුවේ වියදම් අඩු කරගැනීමේ අරමුණින් සීමිත වශයෙන් දේශීය කෘෂි අංශය දියුණු කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගැනීම.

  උදාහරණ :

  ⇒ මුතුරාජ වෙල අස්වැද්දීම

  ⇒ වැව් රැසක් ප්‍රතිසංස්කරණය කිරීම (යෝධ කණ්ඩිය, කන්තලේ කිරම, ඌරු බොක්ක)
- ඉන්ඩිගෝ, කපු වැනි දෑ වගාකොට සීනි නිපදවීම.
- රෙදි සායම් කිරීම සහ රෙදි විවීම වැනි කර්මාන්ත පුළුල් කිරීම.
- බදු අය කිරීම් ක්‍රමවත් කිරීමට තෝම්බු සැකසීම.
- බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසි කිරීමේ ක්‍රමය ආරම්භ කිරීම.
- උපරිම ලාභ ලැබීමේ අරමුණින් යුද වියදම් අවම කිරීම.

## ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය

- ප්‍රොතෙස්තන්ත හෙවත් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම.
- බෞද්ධ, හින්දු හා කතෝලික ජනයා රෙපරමාදු ආගමට හරවා ගැනීමට දේවගැතිවරුන් ක්‍රියාකිරීම.
- රෙපරමාදු ක්‍රිස්තියානිය වැළඳ ගන්නා අයට උසස් තාන්න මාන්න තෑගි බෝග හා ප්‍රශංසා ලබා දීම.
- ඉස්කෝල ආරම්භ කර ඒවා ආගම් ප්‍රචාරයට ඉවහල් කරගැනීම.
- අන්‍යාගමික ළමයි බෞතීස්මයෙන් පසු පාසල් වලට ඇතුළත් කරගැනීම.
- යුරෝපීය දරුවන් සඳහා කොළඹ සෙමනේරිය වැනි වෙන ම පාසල් ආරම්භ කිරීම.
- ගුරුවරුන් පුහුණු කිරීමට කොළඹ නගරයේ නෝමල් පාසල ආරම්භ කිරීම.
- අධ්‍යාපන කටයුතු මණ්ඩලයක් මගින් පාලනය වීම.
- 1739 සිංහල මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දී සිංහලයෙන් බයිබලය මුද්‍රණය කර බෙදා හැරීම.

## ලන්දේසි සමාජ හා සංස්කෘතික බලපෑම්

- රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වාදීම නිසා මෙරට පැවති බහු විවාහ ක්‍රමය වෙනුවට ඒක විවාහ ක්‍රමය නීති ගත වීම ඇතුළු සමාජ වෙනස්කම් රැසක් සිදු වීම. දේශීය ජනයා ස්වකීය ආගමට බඳවා ගැනීම විවිධ උපක්‍රම ඔස්සේ සිදු කිරීම නිසා කුල ක්‍රමය.
- පදනම් කරගත් දේශීය සමාජ ක්‍රමය වෙනස් වී කුල ක්‍රමය සංචලනයක් සිදු වීම පෘතුගීසි හා ලන්දේසි මිශ්‍ර විවාහ ඇති වී බර්ගර් නම් වූ මිශ්‍ර ජන කොටසක් මෙරට සමාජයට එකතු වීම.

අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ස්වදේශික භාෂාවලට විවිධ වචන එක් වීම හා ඔවුන්ගේ ආහාර පාන වලට හා ඇඳුම් - පැලඳුම් වලට හුරුවීම මඟින් දේශීය ජන සමාජයේ පුළුල් වෙනසක් සිදු වීම.

    උදාහරණය:-

    ⇒ ලන්දේසි වචන - පොල්ම:කාර . අද්මිනිස්ත්‍රිකාර . ඉස්තෝප්පුව, සොල්දරය, ඔරලෝසුව

    ⇒ ලන්දේසි ආහාර - කොකිස්

- ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පය අනුව සෑදූ කුලුණු සහ උස් උළුවහු සහිත නිවාස ඉදි කිරීම.

    උදාහරණ -

    ⇒ ආදුරුප්පු වීදියේ ඇති පල්ලිය හා පාසල

- ඕලන්ද ශිල්පීය ක්‍රමයට අනුව සෑදූ අල්මාරි පෙට්ටගම්, පුටු, ඇඳ, මේස ආදී ගෘහ භාණ්ඩ හඳුන්වා දීම බටහිර වෛද්‍ය සේවයක් ඇරඹීම.
- මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීම.
- ලාදුරු රෝගය නිරාවරණයට ලාදුරු රෝහල් හඳුන්වා දීම.

## ප්‍රශ්නෝත්තර සාකච්ඡාව

* **මෙම පාඩම ඇසුරින් ඇසිය හැකි ප්‍රශ්න හා ඒවාට පිළිතුරු සැපයීමට යොදාගත හැකි දළ සැලැස්ම.**

1. **ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පළාත් වල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ පරිපාලන ප්‍රතිපත්ති පහත දැක්වෙන අංශ ඇසුරෙන් සංසන්දනාත්මක ව පරීක්ෂා කරන්න.**

**(i) අරමුණු**

- පෘතුගීසීන්ගේ මෙන්ම ලන්දේසීන්ගේත් ප්‍රධාන අරමුණ වූයේ ලංකාවෙන් කුළු බඩු - විශේෂයෙන් කුරුඳු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීමයි.
    - ⇒ පෘතුගීසි යටත් විජිත කාලය තුළ පෘතුගාලයේ රාජ්‍ය අධිකාරිය විසින් මෙහෙයවන ලද අතර, ලන්දේසි යටත් විජිත කටයුතු ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් මෙහෙයවන ලදී.
    - ⇒ මේ තත්ත්වය යටතේ ලන්දේසීන් අතර වෙළඳ (ආර්ථික) අරමුණු වඩාත් බල පැවැත්වූ බව කිව හැකිය.
- ආගම් ප්‍රචාරය කිරීමේ අරමුණ:
    - ⇒ කතෝලික - පෘතුගීසීන්
    - ⇒ ලන්දේසීන් - ප්‍රොතෙස්තන්ත ආගම
- ලංකාව තුළ සිය දේශපාලන බලය පිහිටුවීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**(ii) මධ්‍ය පාලනය**

- පෙරදිග පෘතුගීසි අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවේ හි ස්ථාපිත කොට තිබූ අතර එහි ප්‍රධානියා ප්‍රතිරාජයා ලෙස හැඳින්විණ.
- පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය ජාවා දූපතේ බතාවියාවේ පිහිටුවා තිබූ අතර එහි ප්‍රධානියා, මහාණ්ඩුකාරවරයා ලෙස හැඳින්විණ.
- ලංකාවේ පෘතුගීසි පාලන සංවිධානයේ ප්‍රධානියා වූයේ කපිතාන් ජෙනරාල්වරයාය. පුළුල් බලතල ඔහුට තිබූ අතර, විදොර් ද පසෙන්දා හා උවිදෝර් ද පසෙන්දා යන නිලධාරීහු රාජ්‍ය ආදායම් පාලන හා අධිකරණ අංශවල ප්‍රධානීන් වූහ.
- ලන්දේසි පාලන සංවිධානයේ ප්‍රධානියා වූයේ ආණ්ඩුකාරවරයාය. ඔහුට සහාය වීමට උපදේශක සභාවක් තිබූ අතර ඔහුට පුළුල් බලතල පැවතුණි.
- දෙපක්ෂයම, ඉහළ නිලතලවලට, ස්ව-ජාතිකයන්ම පත් කළහ.

**(iii) ප්‍රාදේශීය පරිපාලනය**

**පෘතුගීසි**

- කෝට්ටේ රාජ්‍යයේ පැවති පාලන රටාව එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.
- ඔවුන් යටතේ පැවති ප්‍රදේශය දිසාවනි හතරකට බෙදා තිබීම (මාතර. සබරගමුව. සත් කෝරළය, සතර කෝරළය).
- දිසාවනියක් තුළ කෝරළ, පත්තු හා ගම් අඩංගු වූ පරිපාලන සංවිධානය.
- කපිතාන්වරයෙකු යටතේ වූ යාපනය ප්‍රදේශයේත් එම ප්‍රදේශයේ කලින් ක්‍රියාත්මක වූ ස්වදේශික පාලන ව්‍යුහය හා පාලන නිලතල එලෙසම ක්‍රියාත්මක කිරීම.
- දිසාවනියක් සඳහා දිසාවේවරයෙකු පත් කරන ලද අතර ඒ සඳහා පෘතුගීසි ජාතිකයෙකුම පත් කිරීම.
- දේශීය බද්ද සංවිධානය, රාජකාරි ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.

**ලන්දේසි**

- ලන්දේසීන් ද දේශීය පාලන ව්‍යුහය හා යාන්ත්‍රණය එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.
- ලන්දේසි පාලන ප්‍රදේශය කොමාන්ඩරි වලට (දිසාවනි) බෙදා තිබීම ( කොළඹ. ගාල්ල, යාපනය) - ඒවා කොමදෝරුවරුන් යටතේ පාලනය විම
- කොමාන්ඩරි තුළ ද කලින් පැවති දේශීය පාලන ව්‍යුහය හා පාලන නිලතල ක්‍රියාත්මක කිරීම.
- ඉහළ නිලතලවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම.
- දේශීය බද්ද සංවිධානය, රාජකාරි ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.
- පෘතුගීසීන්ට වඩා අධිකරණ පරිපාලනය කෙරෙහි සැලකිලිමත් වීම.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

2. **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසීන් හා ලන්දේසීන් ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තිය තුලනාත්මකව පරික්ෂා කරන්න.**

- පෘතුගීසීන්: පෙරදිගට පැමිණීමට අරමුණු දෙකක් මුල් විය (වස්කෝ ද ගාමාගේ ප්‍රකාශය 'අප මෙහි පැමිණියේ කුළුබඩු හා ක්‍රිස්තියානීන් සොයාගෙනය.')
    1. වාණිජ - වෙළඳ ද්‍රව්‍ය (විශේෂයෙන් කුළුබඩු) යුරෝපයට ගෙනගොස් විකුණා ලාභ ඉපයීම
    2. ආගමික - කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- ලන්දේසීන්: ඔවුන්ද පැමිණියේ වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම සහ ස්වකීය ආගම වූ ප්‍රොතෙස්තන්ත ආගම (කැල්වින් දහම) ප්‍රචාරය කිරීමටයි. එසේ වුවත්, ලන්දේසීන්ගේ ආර්ථික අරමුණ පෘතුගීසීන්ට සාපේක්ෂව වඩාත් ප්‍රබල වී යැයි කිව හැක.

- පෘතුගීසීන්ගේ මෙන්ම ලන්දේසීන්ගේ ද ආර්ථික ප්‍රතිපත්තිය වූයේ ශ්‍රී ලංකාවෙන් වෙළඳ ද්‍රව්‍ය විශේෂයෙන් කුළුබඩු ලබා ගැනීමයි.
- පෘතුගීසි ප්‍රතිපත්තිය එරට රජය විසින් ද ලන්දේසීන්ගේ ප්‍රතිපත්තිය ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් ද මෙහෙයවනු ලැබීය. ඒ නිසා පෘතුගීසි ප්‍රතිපත්තියට වඩා ලන්දේසි ප්‍රතිපත්තිය උපරිම ලාභ ලබා ගැනීමට හැකිවන ආකාරයට සංවිධානය කර තිබුණි.
- පෘතුගීසීන් මෙන්ම ලන්දේසීන් ද ලංකාවේ වෙළඳාම සම්බන්ධයෙන් වෙළඳ ඒකාධිකාරයක් පවත්වා ගැනීමට ක්‍රියා කළහ. කුරුඳු ඒකාධිකාරයක් පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරුණි.මෙම ඒකාධිකාරී ප්‍රත්පත්තිය ස්වදේශිකයන්ට හිතකර නොවීය.
- දෙපාර්ශවයම සිය ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා දේශීය සම්ප්‍රදායන් හා පාලන සංවිධාන උපයොගී කර ගත්හ (අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය. කුල ක්‍රමය, මහබද්ද දෙපාර්තමේන්තුව වැනි).
- විවිධ බදු වර්ග මගින් ආදායම වැඩිකර ගැනීම දෙපාර්ශවයේම ප්‍රතිපත්තිය විය.
- පෘතුගීසීන් මෙන්ම ලන්දේසීන්ද තෝම්බු සකස් කිරීම මගින් ඉඩම් බදු විධිමත්ව උපරිමයෙන් අය කිරීමට වග බලා ගත් අතර සාම්ප්‍රදායානුකූල දැකුම් මගින් ද ( ඔරු පාරු බදු, මරාළ බද්ද) හැකි තරම් ආදායම රැස්කර ගත්හ.
- දෙපාර්ශවයේම ආර්ථික ප්‍රතිපත්තිය හේතු කොටගෙන මුහුදුබඩ ප්‍රදේශවල රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ විදේශ වෙළඳාමයි. දේශීය රජවරුන් යටතේ රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය ඉඩම් වූ අතර විදේශ වෙළඳාමෙන් අමතර ආදායමක් ලැබුණි.
- පෘතුගීසීන් මෙරට ස්වභාවිකව වැඩුණු කුරුඳු සහ ගොවින්ගේ ගෙවතු වලින් ලැබුණු වෙනත් වෙළඳ ද්‍රව්‍ය හැකි තරම් ලබාගෙන වෙළඳාම පුළුල් කිරීමට වෙහෙසුණු අතර ලන්දේසීනගේ ප්‍රතිපත්තියේ ඊට වඩා වෙනසක් දක්නට තිබුණි.
- ලන්දේසීන්ගේ මෙරට පාලන කටයුතු මෙහෙය වූයේ වෙළඳ සමාගමක් වූ බැවින් උපරිම ලාභය ලැබිය හැකි වන පරිදි මෙරටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය හැකි තරම් මෙරට වගා කිරීමට පියවර ගත්හ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ⇒ කෘෂිකර්මාන්තය: වහලුන් පවා ගෙන්වාගෙන ගොවිතැන් කටයුතු දියුණු කිරීමට පියවර ගත්හ.
- ⇒ වැව්, අමුණු, වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම (කිරම. ඌරු බොක්ක).
- ⇒ මුහුදු ජලය ගලා ඒම නවත්වා මුතුරාජ වෙල ගොවිතැන් කටයුතු සඳහා සුදුසු පරිදි සකස් කිරීම.
- ⇒ ප්‍රවාහන කටයුතු සඳහා ඇල මාර්ග ඉදිකිරීම.
- ⇒ මෙරට දියුණු කළ හැකි කර්මාන්ත කිහිපයක් ආරම්භ කිරීම (උක්, කපු, සහ ඒවාට අදාළ නිශ්පාදන කිරීමට පියවර ගැනීම).
- ⇒ මොරටුව වඩු වැඩ වැනි දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් නිශ්පාදන පුළුල් කිරීම.

- ලන්දේසීන් කුළු බඩු වර්ග විශේෂයෙන් කුරුඳු මෙරට වතු වගාවක් වශයෙන් ආරම්භ කිරීමට පියවර ගත්හ. ඇවරිවත්ත, කදිරාන, කොළඹ, වැනි ප්‍රදේශවල කෝපි වගා කිරීමට අත්හදා බැලීම් කලහ.

**3. පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යය තුළ ස්වකීය බලය පිහිටුවා ගත් ආකාරය විමසන්න.**

* ප්‍රධාන වශයෙන් ආර්ථික අරමුණුද ද්විතීයික වශයෙන් ආගමික අරමුණුද පෙරදැරි කරගෙන ලංකාවට පැමිණි පෘතුගීසීහු මෙරට පැවති දේශපාලන අස්ථාවරභාවය හේතුකොටගෙන දේශපාලන/ප්‍රදේශ ආධිපත්‍යයක් ගොඩනගාගැනීමට පෙළඹුණහ.

- පෘතුගීසීන් 1505 දී පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූයේ අටවන වීර පරාක්‍රමබාහු රජුය. මෙම රජු වෙළඳ ගබඩාවක් හා පල්ලියක් සෑදීමට පෘතුගීසීන්ට අවසර ලබාදීම.
- හය වන විජයබාහු රජුගේ සමයේදී 1521 'විජයබා කොල්ලය' සිදුවීම නිසා කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදීයාම.
  - ⇒ හත්වන බුවනෙකබාහු - කෝට්ටේ
  - ⇒ මායාදුන්නේ - සීතාවක
  - ⇒ රයිගම් බණ්ඩාර - රයිගම
- VII බුවනෙකබාහු හා මායාදුන්නේ අතර හටගත් අරගල වලදී කෝට්ටේ රජු වූ VII බුවනෙකබාහු පෘතුගීසීන්ගේ සහාය පැතූ අතර මායාදුන්නේ මුස්ලිම්වරුන්ගේ සහාය ලබා ගත්තේය.
- මේ සටන්වලින් VII බුවනෙකබාහු ජයගත්තද, සීතාවක රාජ්‍යය මුළුමනින්ම දුබල කිරීමට ඔහු අසමත් විය.
- VII බුවනෙකබාහුගෙන් පසු ඔහුගේ මුනුබුරු ධර්මපාල කෝට්ටේ රජකමට පත්වූ අතර ඔහු පෘතුගීසීන්ට බෙහෙවින් අවනත පාලකයෙකු විය. මායාදුන්නේ හා සීතාවක රාජසිංහ යටතේ සීතාවක රාජ්‍යයේ ව්‍යාප්තියක් ඇති වූ අතර සීතාවක පාලකයෝ කෝට්ටේ පාලන බලය කොළඹට පමණක් සීමා කිරීමට සමත් වූහ.
- එහෙත් ඉන් අනතුරුව සීතාවක රාජ්‍යය සීඝ්‍ර පරිහානියකට පත්විය. මේ අතරතුර ධර්මපාල මුළුමනින්ම පෘතුගීසීන්ගේ රූකඩ පාලකයෙකු බවට පත්වීම හා ඔහු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට පවරා දීම.
- ධර්මපාලගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන් අතට පත්වීම.
- 1597 දී කෝට්ටේ ප්‍රධානීන් සහ පෘතුගීසීන් අතර ඇති වී යැයි කියන 'මල්වානේ ගිවිසුමෙන්' පෘතුගීසීන් සිය අභිමතාර්ථ සාධනය කරගැනීම.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**4. පෘතුගීසීන් යාපනය රාජධානිය යටත්කර ගැනීමට ගත් උත්සහය විමසන්න.**

- පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධිය වන විට යාපනය රාජධානිය, යාපන අර්ධද්වීපය, පුත්තලම හා ත්‍රිකුණාමලය වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි වර්ධනය වී තිබීම.
- එවකට එහි පාලකයා පරරාජසේකරම් විය.
- 16 වන සියවස මුල් අවධියේ යාපනය රාජධානිය කෙරෙහි පෘතුගීසීන් එතරම් අවධානයක් යොමු නොකරන ලද අතර ඊට හේතු වූයේ,
  - ⇒ ඔවුන් කෝට්ටේ රාජධානිය පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම හා, කුළුබඩු වෙළඳාමෙන් ලාභ ඉපයීම සඳහා වූ අභිප්‍රායයි.
- 1520 ගණන්වල සිට ඔවුන් යාපන රාජධානිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම. ඊට බලපෑ හේතු ගණනාවකි.
  - ⇒ සංකිලි එහි කතෝලික ආගම් ප්‍රචාරක කටයුතුවලට එරෙහිව කටයුතු කිරීම
  - ⇒ ආරක්ෂාව කර ගැනීම
  - ⇒ වෙරළ ආශ්‍රිතව මුහුදුබත් වන නැව්වල භාණ්ඩ රාජසන්තක කිරීම
- මෙම කරුණු හේතු කරගෙන පෘතුගීසීන් යාපන රාජධානිය සම්බන්ධයෙන් ආක්‍රමණශීලී ප්‍රතිපත්තියකට මුලපිරීම
- 1543 සංකිලිට එරෙහිව මාර්ටින් අෆොන්සෝ ද සූසා එල්ල කළ ආක්‍රමණය
- 1560 කොන්ස්තන්තිනු ද බ්‍රැගන්සා එල්ල කළ ආක්‍රමණය හා පෘතුගීසීන් තමන්ට අවනත පෙරියපුල්ලේ සේගරසශේකරම් නම් පාලකයා පත් කිරීම.
- 1591 දී මැන්ඩොන්සා එල්ල කළ ආක්‍රමණයෙන් පසු යාපන රාජධානිය යටත් කර ගන්නා ලදී.
- නල්ලූර් ගිවිසුම හා අර්ධ-පෘතුගීසි පාලනයක් ස්ථාපනය කිරීම.
- 1619 වනවිට සංකිලි බලයට පත්වීමෙන් පසු හටගත් විරෝධතා, පිලිප් ද ඔලිවේරා විසින් පසුව මර්ධනය කරන ලදී.
- 1621 දී පෘතුගීසීන් මුළුමනින්ම යාපන රාජධානිය තුළ බලය තහවුරු කරගැනීම.

**5. උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා පෘතුගීසීන් විසින් දරන ලද ප්‍රයත්න පැහැදිලි කරන්න.**

- පෘතුගීසීන් ලංකාවට පැමිණියේ මූලික වශයෙන් තම ආර්ථික හා ආගමික අරමුණු ඉටුකර ගැනීමට වුවත්, දිවයිනේ පැවති දේශපාලන වියවුල් සහගත තත්ත්වය හේතුකොට ගෙන ඔවුහු ලංකාව තුළ සිය දේශපාලන ආධිපත්‍යය පිහිටුවීමට ක්‍රියා කළහ.
  - ⇒ රටතුළ පැවති දේශපාලන බල අරගලයේම අතුරු ඵලයක් ලෙස, උඩරට රාජධානිය හා පෘතුගීසීන් අතර සබඳතා, උඩරට ජයවීර නම් පාලකයාගේ පාලන සමයේදී ආරම්භ වීම.
  - ⇒ පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කිරීමට බලපෑ ප්‍රධාන සාධක දේශපාලන ස්වරූපයක් ගෙන ඇත:


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ලාංකීය රාජ්‍යයක් බවට පත් කර ගැනීම, කෝට්ටේ අත්පත් කරගැනීමෙන් පසුව මුළු දිවයිනම යටත් කර ගැනීමට තිබූ අවශ්‍යතාව, රට මැද ස්වාධීන රාජ්‍යයක් තිබීම තර්ජනයක් වීම, උඩරට ලන්දේසීන් සමග සබඳතා ගොඩනැඟීමට උත්සාහ දැරීම, වෙරළබඩ වැසියන් උඩරට රජු තම පාලකයා වශයෙන් සැලකීම හා රජු පෘතුගීසි පාලන ප්‍රදේශයේ ස්වදේශික කැරලිකරුවන්ට සහය දීම.
  - ⇒ ක්‍රි.ව. 1550දී පෘතුගීසීන් උඩරටට අසාර්ථක ආක්‍රමණයක් එල්ල කිරීම.
  - ⇒ පළමුවන විමලධර්මසූරිය රජුගේ පාලන සමයේදී හා ඉන් පසු පෘතුගීසීන් කිහිපවරක් උඩරට ආක්‍රමණය කිරීම.

**1) 1594 දන්තුරේ සටන**

- මෙකල උඩරට පාලකයා වූයේ I වන විමලධර්මසූරිය රජුය. පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා වූයේ පේරෝ ලෝපෙස් ද සූසාය. පෘතුගීසි හමුදාව ප්‍රධානීන් අවස්ථාවලදී එම හමුදාව දන්තුරේදී විමලධර්මසූරිය රජුගේ ප්‍රහාරයකට ලක් වූ අතර කපිතාන් ජෙනරාල් ප්‍රමුඛ ඇතුළු පෘතුගීසි හමුදාව සමූල ඝාතනය කරනු ලැබීය. මෙය පෘතුගීසීන් පෙරදිගදී ලැබූ දරුණුතම පරාජයකි.

**2) 1602 බලන සටන**

- 1602 ජනවාරි මස ආක්‍රමණය සිදු විය. පෘතුගීසි කපිතාන් ජෙනරාල් දොන් ජෙරනිමෝ ද අසවේදු, සිමන් පිංඤ්ඤෝ හා සමරකෝන් මුදලි ආක්‍රමණය මෙහෙයවූහ. පෘතුගීසීන් සමග සිටි ලස්කිරිඤ්ඤ හමුදාව උඩරට රජුට එකතු වී පෘතුගීසීන්ට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් බලන කොටුව අතහැර යාමට පෘතුගීසීන්ට සිදු විය.

**3) 1630 රන්දෙණිවෙල සටන**

- මෙකල උඩරට පාලකයා වූයේ සෙනරත් රජුය. කොන්ස්තන්තිනු ද සා ආක්‍රමණය මෙහෙයවූ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා විය. සිංහල ප්‍රධානීන් කිහිප දෙනෙක් ඔවුන් යටතේ සිටි ලස්කිරිඤ්ඤයන් ද සමග උඩරට රජුට එකතු වීමත් අධික වර්ෂාවත් හේතුවෙන් පෘතුගීසි යුධ ශක්තිය හීන විය. පෘතුගීසි හමුදාව රන්දෙණිවෙලදී වට කොට දින දෙකක් තිස්සේ මරණ ලද සටනින් මහා අන්ත පරාජයක් උදෙසා උඩරට හමුදාව ජයග්‍රහණය ලැබීය. කොන්ස්තන්තිනු ද සාද මරණයට පත් විය.

**4) 1638 ගන්නෝරුව සටන**

- මෙකල උඩරට පාලකයා වූයේ දෙවන රාජසිංහ රජුය. පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා වූයේ දියෝගු ද මෙලෝ ද කැස්ත්‍රෝය. ආක්‍රමණය 1638 මාර්තු මාසයේදී සිදු විය. සෙංකඩගල නගරය අතහැර ගන්නෝරුව අඩවියට සිටි දෙවන රාජසිංහ රජු ප්‍රමුඛ සිංහල හමුදාව විසින් පෘතුගීසි හමුදාව වටලා සමූල ඝාතනය කරනු ලැබීය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**එම ප්‍රයත්න අසාර්ථක වීමට බලපෑ සාධක**

- උඩරට රාජ්‍යයේ ස්වභාවික භූගෝලීය පිහිටීම (ගිරිදුර්ග, වනදුර්ග, ජලදුර්ග).
- උඩරටියන් ගරිල්ලා සටන් ක්‍රම අනුගමනය කිරීම.
- පළමුවන විමලධර්මසූරිය රජු හා ඔහුගෙන් පසු බලයට පත් උඩරට පාලකයන් රාජධානිය තුළ ස්ථාවර බලයක් ගොඩනගා ගෙන තිබීම.
- ඔවුන්ට උඩරට පමණක් නොව පහතරට සිංහල ජනතාවගේ පක්ෂපාතීත්වය හිමිවීම.
- පෘතුගීසීන් තම යුධ කටයුතුවල යොදාගත් ලස්කිරිඤ්ඤ හමුදාව තීරණාත්මක අවස්ථාවලදී පෘතුගීසි හමුදාවලින් මිදී උඩරට රජුට පක්ෂපාතී වීම.
- උඩරට රජවරුන් දක්ෂතාව හා උපක්‍රමශීලී බව (පළමුවන විමලධර්මසූරිය රජු, දෙවන රාජසිංහ රජු).

**6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් වල පෘතුගීසි හා ලන්දේසි පාලනය හේතුකොටගෙන සංස්කෘතික වශයෙන් ඇති වූ ප්‍රතිඵල කවරේද?**

- මෙහිදී ආගම, අධ්‍යාපනය, සමාජය, කලාව හා ගෘහනිර්මාණ ශිල්පය, ආහාර පාන හා ඇඳුම් පැළඳුම් ආදී ක්ෂේත්‍ර වල ඇති වූ ලද වෙනස්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**ආගම:**

- පෘතුගීසීන්ගේ මෙන්ම ලන්දේසීන්ගේද එක් අරමුණක් වූයේ තම ආගම ප්‍රචාරය කිරීම (කතෝලික ආගම හා ප්‍රොතසේතන්ත ආගම).සඳහා ඔවුහු සංවිධානාත්මක පියවර ගැනීම.
- පාසල් අධ්‍යාපනයේදී නැටුම්, ගැයුම් ආදී අංග මගින් ආගම ව්‍යාප්ත කිරීම.
- බෞද්ධ, හින්දු, ඉස්ලාම් යන ස්වදේශික ආගම් දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරමින් මර්දනය කිරීම.

**අධ්‍යාපනය:**

- ප්‍රධාන වශයෙන් පාසල් අධ්‍යාපනය, ආගම් ප්‍රචාරය සඳහා දෙපාර්ශවය විසින්ම යොදා ගනු ලැබීම. එමගින් යුරෝපයේ පැවති ආකාරයේ පාසල් පද්ධතියක් මෙරට බිහිවීම සඳහා පදනම වැටීම.

**සමාජය**:

- ලන්දේසීන් මෙරටට රෝම- ලන්දේසි නීතිය හඳුන්වාදීම: එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට පැවති බහු විවාහ ක්‍රමය වෙනුවට ඒක විවාහ ක්‍රමය නීති ගත වීම හා එමගින් සමාජයේ පුළුල් වෙනස්වීම් ඇති වීම.
- දෙපාර්ශවයම ස්වකීය ආගම වැළඳගත් ජනයාගේ තරා තිරම නොබලා ඔවුන්ට විවිධ වරප්‍රසාද ලබාදීම හේතු කොටගෙන කුල ක්‍රමය පදනම් කරගත් ස්වදේශික සමාජ ක්‍රමයේ වෙනස්වීම් ඇති වීම හා කුල සංචලනයට මග පෑදීම.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- පෘතුගීසි ජාතික හා ලන්දේසි ජාතික පුරුෂයන් හා ස්වදේශික කාන්තාවන් අතර මිශ්‍ර විවාහ ඇති වීම; මෙරට ජන සංයුතියට 'බර්ගර් ' නම්වූ මිශ්‍ර ජන කොටසක් එක්වීම.
- ස්වදේශික භාෂාවලට විවිධ වචන එක්වීම හා ඔවුන්ගේ ආහාරපාන හා ඇඳුම් පැළඳුම්වලට හුරුවීම (අච්චාරු, කොකිස්) හේතුකොටගෙන දේශීය ජන සමාජයේ වෙනස්වීම් හටගැනීම.
- පෘතුගීසි හා ලන්දේසි පුද්ගල නාම හා වාසගම් භාවිතයට ගැනීම. නිදර්ශණඃ ජුවාන්, කතිරිනා, සිල්වා, ප්‍රනාන්දු, පෙරෙයිරා.

### කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය:

- ක්‍රිස්තියානි ආගමික මුහුණුවරක් ගත් නාට්‍ය, සංගීතය වැනි කලා අංශ වර්ධනය වීම. (නිදසුන් බයිලා, කපිරිඤ්ඤා හා පාස්කු නාට්‍ය).
- ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය මෙරටට විශේෂ බලපෑමක් ඇති කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk




Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **පහත ස්ථාන ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.**

කෝට්ටේ, රයිගම, සීතාවක, මහනුවර, ගන්නෝරුව

රන්දෙණිගල, බලන, කැළණිය, කොළඹ, මල්වාන

යාපනය, ගාල්ල, මඩකළපුව




අන්තර්ගතය සකස් කිරීම : අයි.එම්. ධම්මික කුමාර ඉලන්කෝන් මයා - ගුරු උපදේශක - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල

අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk